15680

AL/2025/28/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ගෘහ ආර්ථික විද්‍යාව I
மனைப் பொருளியல் I
Home Economics I

28 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. නිර්මාණකරණයේ මූලිකාංග දෙකකි,
(1) රේඛා සහ වටිනාකම.
(2) තීව්‍රතාව සහ හැඩය.
(3) වටිනාකම සහ වයනය.
(4) රේඛා සහ තීව්‍රතාව.
(5) හැඩය සහ වයනය.

2. බාහිර හා අභ්‍යන්තර අවකාශ නිර්මාණය හා සම්බන්ධ නිර්මාණකරණයේ මූලධර්ම හා බැඳි නිවැරදි වැකිය තෝරන්න.
(1) දිග, පළල, උස, බර හා ප්‍රමාණය එකිනෙකට ගැළපීම සමානුපාතයයි.
(2) එකම ලක්ෂණය චක්‍රාකාරයෙන් පෙන්නුම් කිරීම ආසාත්මක රිද්මයයි.
(3) වර්ණය, වයනය සහ ප්‍රමාණය එකිනෙක ඉක්මවා යන සේ ප්‍රබලත්වය සීරු මාරු කර ගැනීම සමෝධානයයි.
(4) උපාංග, මධ්‍ය ලක්ෂයේ සිට අසමාන දුරින් පිහිටුවීම සමමිතික තුලනයයි.
(5) හැඩය, වර්ණය හා වයනය එකම ආකාරයෙන් ගැළපීම ඒකමිතියයි.

3. නිර්මාණයක ක්‍රියානුරූපී බව හා සම්බන්ධ වඩාත් ගැලපෙන ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.
A - ඒකාකාරී බවින් මිදී නූතන හැඩතලවලින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම
B - ගොඩනැගිලි භාවිත කරන්නන්ගේ මානසික තත්ත්වයට වඩා ඔවුන්ගේ ශ්‍රමය ප්‍රමුඛ වීම
C - ගොඩනැගිලිවල ආලෝක ව්‍යුහ, ප්‍රාදේශීය නියාමන ප්‍රමිතීන්වලට අනුකූල වීම
(1) A පමණි.
(2) C පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B, සහ C යන සියල්ලම ය.

4. චිත්‍ර ශිල්පීන්, 'ෆයිබොනාසි චක්‍රය' යන සංකල්පය භාවිත කරනුයේ නිර්මාණකරණයේ කිනම් මූලධර්මය සඳහා ද?
(1) අසමමිතික තුලනය
(2) සමෝධානය
(3) ආසාත්මික රිද්මය
(4) අවධාරණය
(5) සමානුපාතය

5. උක්, කිරි සහ පැලවෙන ධාන්‍යවල බහුලව අඩංගු වන ඩයිසැකරයිඩ පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.
(1) මෝල්ටෝස්, ගැලැක්ටෝස්, සුක්‍රෝස්
(2) සුක්‍රෝස්, ලැක්ටෝස්, මෝල්ටෝස්
(3) මෝල්ටෝස්, සුක්‍රෝස්, ලැක්ටෝස්
(4) සුක්‍රෝස්, ගැලැක්ටෝස්, මෝල්ටෝස්
(5) ග්ලූකෝස්, සුක්‍රෝස්, ලැක්ටෝස්

6. මහා පෝෂක පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තැම්බූ බිත්තර සුදු මදයේ ඇති ඇල්බියුමින් කැටි ගැසීම මගින් ප්‍රෝටීන ගුණ හානි වේ.
(2) රනිල බෝග සම්පූර්ණ ප්‍රෝටීන සඳහා උදාහරණ වේ.
(3) සියලුම ලිපිඩවල සංයුතිය වනුයේ කාබන්, හයිඩ්‍රජන් සහ ඔක්සිජන් ය.
(4) පෘථිවිය මත සුලබම කාබොහයිඩ්‍රේටය පිෂ්ඨයයි.
(5) ලිපිඩ යනු ශරීරයේ සමහර සෛලවල අඩංගු වන සංඝටකයකි.

[දෙවැනි පිටුව බලන්න

Past Papers Wiki

7. සංතෘප්ත සහ අසංතෘප්ත මේද අම්ලවලින් සරු ආහාර පිළිවෙළින් අඩංගු වරණය තෝරන්න.
(1) ඔලිව් තෙල්, ඌරු මස් (2) ඌරු මස්, බටර්
(3) මාළු, සෝයාබෝංචි තෙල් (4) ඌරු මස්, මාළු
(5) සෝයාබෝංචි තෙල්, ඔලිව් තෙල්

8. ආහාර තන්තු පිළිබඳව පහත ප්‍රකාශ සලකන්න.
A - අන්ත්‍රයේ ආහාර ගමන් කරන කාලය අඩු කරයි.
B - බැක්ටීරියා ක්‍රියාකාරීත්වය මගින් කෙටි දාම මේද අම්ල සාදයි.
C - රුධිරගත කොලෙස්ටරෝල් මට්ටම පාලනයට උපකාරී වේ.
ඉහත කරුණු අතුරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න,
(1) A පමණි. (2) A සහ B පමණි.
(3) A සහ C පමණි. (4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ලම ය.

9. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ෆෝලික් අම්ලය ලබාගත හැකි වන්නේ සත්ත්ව ආහාරවලින් පමණි.
(2) අල වර්ගවල ප්‍රතිඔක්සිකාරක අඩංගු වේ.
(3) බිත්තරවල සියලුම ජල ද්‍රාව්‍ය විටමින් අඩංගු වේ.
(4) මේදය රහිත කිරි, විටමින් A ප්‍රභවයකි.
(5) ඔමේගා 6 අම්ලය ශරීරය තුළ නිපදවීමට හැකියාවක් ඇත.

10. B කාණ්ඩයේ විටමින් අඩංගු ආහාරයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) මුදවාපු කිරි (2) සෝයාබෝංචි (3) මාළු
(4) බිම්මල් (5) එළවළු තෙල්

11. කාන්තාවකගේ බෝ නොවන රෝග අවදානම වැඩි කරන සාධකයක් වන්නේ මින් කුමක් ද?
(1) BMI අගය 24 ක් වීම (2) නිවුඩ්ඩ සහිත සහල් පමණක් පරිභෝජනය කිරීම
(3) ඇපල් හැඩැති සිරුරක් පැවතීම (4) ශාක ආහාර පමණක් පරිභෝජනය කිරීම
(5) ඉණ : උකුළ අනුපාතය 0.7 ක් වීම

12. ආහාර මාර්ග පද්ධතිය හා සම්බන්ධ පහත කරුණු සලකන්න.
A - පිත් යුෂ මිශ්‍ර වීම
B - pH අගය 5.6-6.9 අතර පැවතීම
C - පයෝලස නාලිකා තිබීම
D - අග්න්‍යාශයික යුෂ ශ්‍රාවය වීම
ඉහත කරුණු අතුරින් ලිපිඩ ජීරණය සහ අවශෝෂණය සඳහා බලපාන්නේ,
(1) A සහ B පමණි. (2) A, B සහ C පමණි.
(3) A, B සහ D පමණි. (4) A, C සහ D පමණි.
(5) A, B, C සහ D යන සියල්ලම ය.

13. ආමාශයේ කෘත්‍යයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) ආහාරය ආම්ලික කිරීම (2) ප්‍රෝටීන ජීරණය අවසන් කිරීම
(3) ආහාර යාන්ත්‍රිකව මිශ්‍ර කිරීම (4) ඇමයිලේස් එන්සයිමය අක්‍රිය කිරීම
(5) හෝමෝන නිපදවීම

14. පහත කරුණු සලකන්න.
A - කාලීන මන්දපෝෂණ තත්ත්වයකි.
B - අත්‍යාවශ්‍ය පෝෂකවල ගුණාත්මක බව අඩු වීම.
C - අත්‍යාවශ්‍ය පෝෂකයන්ගේ ප්‍රමාණාත්මක ඌනතාව.
මේවා අතුරින් ක්වොෂියෝකෝර් තත්ත්වය පිළිබඳ නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) A සහ B පමණි.
(3) A සහ C පමණි. (4) B සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ලම ය.

[තුන්වැනි පිටුව බලන්න

15. ආහාර පිරමීඩයට අනුව ආහාර කාණ්ඩ හා ඒවාට අදාළ දෛනික ආහාර ප්‍රමාණ පහත දක්වා ඇත.

ආහාර කාණ්ඩය	දෛනික ආහාර ප්‍රමාණය
A - බත්, පාන්, ධාන්‍ය වර්ග, අල වර්ග	6 - 11
B - එළවළු	3 - 5
C - කිරි හා කිරි නිෂ්පාදන	2 - 4

ඉහත ආහාර කාණ්ඩ හා ඒවාට අදාළ ආහාර ප්‍රමාණ නිවැරදිව ගැලපෙන ප්‍රකාශ වන්නේ,

(1) A පමණි. (2) B පමණි.
(3) A සහ B පමණි. (4) A සහ C පමණි.
(5) A, B සහ C යන සියල්ලම ය.

16. අධිපෝෂණය වැළැක්වීමට සුදුසු ආහාර වේලක බහුලව අඩංගු විය යුතු ආහාර වර්ග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) එළවළු සලාද, මාෂ බෝග
(2) තෙල් සහිත ඇට වර්ග, පලතුරු
(3) මෝල්ට් පාන, පලතුරු
(4) තෙල් සහිත ඇට වර්ග, මෝල්ට් පාන
(5) මාෂ බෝග, වියළි පලතුරු

17. පිසීමේ ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අවම කාලයක් තුළ පිසගැනීම සිදුවේ.
B - පිසීම සඳහා මේදය ස්වල්පයක් භාවිත වේ.
C - වියළි තාපයෙන් පිසීම සිදු වේ.
D - මස්, මාලු පිසගැනීමට යොදා ගනී.

ඉහත ප්‍රකාශ අතුරින් රෝස්ට් කිරීම හා සම්බන්ධ වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි.
(3) B සහ C පමණි. (4) B සහ D පමණි.
(5) C සහ D පමණි.

18. දිලීර විශේෂයක් වන ඇස්පජිලස් ඔරයිසේ (*Aspergillus oryzae*) යොදා ගනිමින් නිෂ්පාදනය කරන ආහාරය මින් කුමක් ද?

(1) විනාකිරි (2) සෝයා සෝස් (3) පලතුරු යූෂ
(4) යෝගට් (5) මස් වර්ග

19. ආහාර පරිරක්ෂණය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

A - දුම් ගැසීමේ දී දුමෙහි පවතින ෆීනෝලික සංයෝග ආහාරය මතුපිට තැන්පත් වේ.
B - ශීතනයේ දී ක්ෂුද්‍රජීවී ක්‍රියා නිෂේධනය වීමත් එන්සයිම අක්‍රිය වීමත් සිදු වේ.
C - බෙර වියලනය භාවිත වනුයේ ද්‍රව ආහාර සඳහා පමණි.
D - ආහාරය විනාඩි කිහිපයක් ජල වාෂ්පයට නිරාවරණය කිරීම මගින් බ්ලාන්චිකරණය කළ හැකිය.

මේවායින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A සහ C පමණි. (2) A සහ D පමණි.
(3) B සහ D පමණි. (4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

20. රස ප්‍රවර්ධක ලෙස ක්‍රියාකරන ආකලන දෙක අඩංගු වරණය තෝරන්න.

(1) මොනොසෝඩියම් ග්ලූටමේට් (MSG) හා ඉනොසිනික් අම්ලය
(2) ලෙසිතීන් හා කාමොසීන්
(3) ප්‍රොපයිල් ගැලේට් හා මොනොසෝඩියම් ග්ලූටමේට්
(4) ඉනොසිනික් අම්ලය හා ලෙසිතීන්
(5) කාමොසීන් හා ප්‍රොපයිල් ගැලේට්

[හතරවැනි පිටුව බලන්න

Past Papers Wiki

21. කෘත්‍රිම පරිරක්ෂණකාරක පිළිබඳ පහත කරුණු අතුරින් **සාවද්‍ය** කරුණ තෝරන්න.
(1) ආහාරය මත වැඩෙන යීස්ට් හා ඇතැම් දිලීර වර්ග ද නිශේධනය කරයි.
(2) මාධ්‍යයේ pH අගය හා උෂ්ණත්වය මත ක්‍රියාකාරීත්වය රඳා පවතියි.
(3) නයිට්‍රේට හා නයිට්‍රයිට උපරිම විෂ තත්ත්වයක් පෙන්වයි.
(4) බෙන්සොඒට, කිරි නිෂ්පාදන සඳහා භාවිත වේ.
(5) සල්ෆයිට් අධිකව එකතු කිරීම ශ්වසන ආබාධ ඇති කරයි.

22. ඇසුරුම් ද්‍රව්‍යයක් වන පොලිඑතිලීන් ටෙරෆ්තැලේට් (PET) පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නැවත භාවිත කළ නොහැකි ය.
(2) තෙල්වලට පාරගම්‍ය නොවේ.
(3) වතුර බෝතල් උදාහරණ වේ.
(4) මිල සාධාරණ ය.
(5) ශක්තිමත් බවින් අඩු ය.

23. වාණිජ මැහුම් ක්‍රමවලදී ස්ථිර මැස්මක් ලෙස භාවිත **නොවන** මැහුම් ක්‍රමයකි,
(1) නොපෙනෙන මැස්ම.
(2) අත් මැස්ම.
(3) අගුලු මැස්ම.
(4) තනි නූලේ දම්වැල් මැස්ම.
(5) අක්වක් අගුලු මැස්ම.

24. **සාවද්‍ය** වැකිය තෝරන්න.
(1) නිමි ඇඳුම් කර්මාන්තයේ දී ඇඳුම් දළ කැපීමකට භාජනය නොකර, අවසාන කැපීම සිදු කරන අවස්ථා ඇත.
(2) රෙදිවල තත්ත්ව පරීක්ෂාවේ දී වියමන, බර, විරංජකවලට ඔරොත්තු දීමේ හැකියාව පරීක්ෂා කළ යුතු ය.
(3) රෙදි කැපීමේ දී භාවිත වන පටි කැපුම් තලය, කැපීමේ දී රෙද්ද හරහා තිරස්ව ගමන් කරයි.
(4) එකකට වැඩි ප්‍රමාණයක් නූල් යෙදූ දම්වැල් මැස්ම අයත් වන්නේ 400 මැහුම් වර්ගයට ය.
(5) මේස රෙද්දෙහි හැඩය කුමක් වුව ද අත් පිස්නාව සමචතුරස්‍රාකාර හැඩයක් ගනී.

25. සෙන්ටිමීටර 175 ක් දිග හා සෙන්ටිමීටර 80 ක් පළල කෑම මේසයක් සඳහා ඇතිරිල්ලක් නිර්මාණය කළ යුතුව ඇත. මේසයේ පැතිවලින් පහළට වැටෙන ප්‍රමාණය සෙන්ටිමීටර 30 කි. ඒ අනුව මේස ඇතිරිල්ලෙහි ප්‍රමාණය විය යුත්තේ,
(1) සෙ.මී. 175 × සෙ.මී. 80 ය.
(2) සෙ.මී. 182 × සෙ.මී. 87 ය.
(3) සෙ.මී. 190 × සෙ.මී. 95 ය.
(4) සෙ.මී. 205 × සෙ.මී. 110 ය.
(5) සෙ.මී. 235 × සෙ.මී. 140 ය.

26. විසිතුරු මැහුම් ක්‍රම හතරක රූපසටහන් පහත දැක්වේ.



මෙම මැහුම් ක්‍රම වනුයේ පිළිවෙළින්,
(1) බ්ලැන්කට් මැස්ම, නැටි මැස්ම, දම්වැල් මැස්ම හා සැටින් මැස්ම ය.
(2) දම්වැල් මැස්ම, සැටින් මැස්ම, බ්ලැන්කට් මැස්ම හා නැටි මැස්ම ය.
(3) සැටින් මැස්ම, දම්වැල් මැස්ම, නැටි මැස්ම හා බ්ලැන්කට් මැස්ම ය.
(4) නැටි මැස්ම, බ්ලැන්කට් මැස්ම, සැටින් මැස්ම හා දම්වැල් මැස්ම ය.
(5) සැටින් මැස්ම, නැටි මැස්ම, දම්වැල් මැස්ම හා බ්ලැන්කට් මැස්ම ය.

27. කෙඳි වර්ග කිහිපයක් පිළිස්සීමේ දී පහත ලක්ෂණ නිරීක්ෂණය විය.
A - කහ පැහැති ගිනිදැල්ලක් ඇතිව දැවීම, අළු පැහැති සැහැල්ලු අළු ඉතිරි වීම
B - දැල්ලෙන් ඉවතට ගත් විට නිවී යාම, කුඩු කළ හැකි අළු බුබුළු ඉතිරි වීම
C - පිළිස්සීමේ දී උණු වීම, කුඩු කළ නොහැකි තද රවුම් අළු ගුලියක් ඉතිරි වීම

මෙම කෙඳි වර්ග පිළිවෙළින්,
(1) ලෝම, ඩැක්‍රෝන් සහ ඇක්‍රිලික් ය.
(2) ඇක්‍රිලික්, කපු සහ ලෝම ය.
(3) කපු, ලෝම සහ ඩැක්‍රෝන් ය.
(4) ඇක්‍රිලික්, ඩැක්‍රෝන් සහ කපු ය.
(5) කපු, ලෝම සහ ඇක්‍රිලික් ය.

28. පහත ප්‍රකාශ සලකන්න.

A - කෙඳි නිෂ්පාදන අවස්ථාවේ සිට රෙදිපිළි නිෂ්පාදනය දක්වා ක්‍රියාවලිය පේෂකර්මාන්තයට අයත් වේ.

B - නයිලෝන් සහ පොලිඑස්ටර් කෙඳි සකස් කිරීමේ දී ද්‍රවායන කැටීම භාවිත වේ.

C - හීරි වියමන චාම් වියමනෙහි ප්‍රභේදයකි.

D - මසර කිරීමට පෙර කපු කෙන්ද්‍රක හරස්කඩ, වෘත්තාකාර හැඩයකින් දිස්වේ.

මින් නිවැරදි වනුයේ,

(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි.
(5) B, C සහ D පමණි.

29. පහත දැක්වෙන ගෙතුම යොදා ගනු ලබන්නේ කුමක් නිර්මාණය කිරීම සඳහා ද?



(1) මදුරුදැල්, යට ඇඳුම්
(2) පිහිණුම් ඇඳුම්, මදුරුදැල්
(3) ටී ෂර්ට්, පිහිණුම් ඇඳුම්
(4) ටී ෂර්ට්, ක්‍රීඩා ඇඳුම්
(5) ක්‍රීඩා ඇඳුම්, මේස්

30. සාය නිර්මාණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පතරොම නිර්මාණයේ දී ආරවාසිය ලෙස ඉණ මිනුමට සෙන්ටිමීටර එකක් එකතු කළ යුතු ය.

B - ඉදිරිපස පතරොමට යොදන්නේ එක් ආරයක් පමණි.

C - පතරොම නිර්මාණයේ දී අංශයට, ඉණට සහ වාටියට සමාන මැහුම්වාසි තැබිය යුතු ය.

D - පිටුපස කැපුම මසා නිමකළ යුත්තේ පසු මැද ඉණ විවරයට සැනගාංචුව ඇල්ලීමෙන් පසුව ය.

මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,

(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) B සහ D පමණි.
(4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

31. වෘත්තියක් තුළ නියමිත ඇඳුම් පැළඳුම් (Dress code) වඩාත් වැදගත් වන්නේ,

(1) ආකර්ෂණීය බව ඉස්මතු වීමටයි.
(2) සුවපහසු බව ගෙන දීමටයි.
(3) පෞරුෂය වර්ධනය කර ගැනීමටයි.
(4) පුද්ගල අනන්‍යතාව පිළිබිඹු වීමටයි.
(5) නූතන විලාසිතාවන්ට අනුකූල වීමටයි.

32. සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - ඔබ සතු හැකියා පමණක් කිව යුතු ය.

B - ආවෘත ප්‍රශ්නවල දී ඔබ සතු හැකියා විස්තර කරමින් කිව යුතු ය.

C - පරීක්ෂණය අවසානයේ ස්තූති කළ යුතු ය.

D - වෘත්තිය අනුව ඔබට අවශ්‍ය වැටුප් ප්‍රමාණය පැවසිය යුතු ය.

මින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි.
(2) D පමණි.
(3) A සහ D පමණි.
(4) B සහ C පමණි.
(5) C සහ D පමණි.

PAST PAPERS WIKI

33. විවේකය සහ ප්‍රතිමෝදනය පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A - විවේකය සඳහා ක්‍රියාකාරකම් තෝරාගැනීමේ දී සමාජ පසුබිමෙහි බලපෑමක් නොමැත.

B - ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් වර්ග කර ඇත්තේ ශාරීරික ක්‍රියාකාරකම් සහ සේවා ක්‍රියාකාරකම් ලෙස ය.

C - යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් ප්‍රතිමෝදනය සඳහා ඉල්ලුම වැඩිවේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

34. සංචරණය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) අන්තර්පුද්ගල සබඳතා දියුණු වීම සමාජයට ලැබෙන ප්‍රතිලාභයකි.
(2) පරිගණක සාක්ෂරතාව හා පරිවර්තන සේවා මගින් භාෂා ගැටළු විසඳෙයි.
(3) සත්කාරකයා තුළ හීනමානය හා ආගන්තුකයා තුළ අධිමානය පිළිබඳ හැඟීම් වර්ධනය වේ.
(4) ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සමාජයට උදා වේ.
(5) විවේක කාලය තුළ කරනු ලබන බැවින් ප්‍රතිමෝදක ක්‍රියාකාරකමකි.

35. මානව පාලිත ආකර්ශණය සඳහා උදාහරණයකි,

(1) නෙළුම් කුළුණ.
(2) දෙහිවල සත්ත්ව උද්‍යානය.
(3) හන්තාන කඳුවැටිය.
(4) විල්පත්තු ජාතික වනෝද්‍යානය.
(5) ඩෙවෝන් දියඇල්ල.

36. සංචරණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - සංචාරකයන්ගේ අළුත් නැමියාව වනුයේ දූරස්ථ රටවල නිවාඩුව ගත කිරීමයි.

B - විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධ කරගැනීම සංචරණයේ ධනාත්මක බලපෑමකි.

C - ආසියාතික සංචාරකයින්ගේ පැමිණීම සංචාරක කර්මාන්තය ශක්තිමත් වීමට හේතුවකි.

මේවායින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

37. ජල පරිභෝජනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා මුළු ජල පරිභෝජනයෙන් 23% ක් පමණ වැය වේ.

B - ජලයේ යෝග්‍යතාව බැලීම සඳහා කරනු ලබන භෞතික පරීක්ෂණය මගින් ජලයේ උෂ්ණත්වය, ඝන ද්‍රව්‍ය සාන්ද්‍රණය හා pH අගය පරීක්ෂා කරයි.

C - වැසි ජලය රෙදි සේදීම සඳහා යෝග්‍ය වේ.

D - වැසිකිලිවල අපජලය, පූතික ටැංකිය තුළ දී බැක්ටීරියා මගින් ජලය හා වායු බවට පත් කරයි.

මින් නිවැරදි වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ D පමණි.
(3) B සහ C පමණි. (4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

38. ගෘහ විදුලි සැපයුම් පද්ධතිය පිළිබඳ **සාවද්‍ය** වැකිය තෝරන්න.

(1) ජාතික විදුලිබල පද්ධතියේ එකලා විදුලිය 230 V හා 50 Hz වේ.
(2) ගෘහ පරිපථයෙහි සජීවී රැහැන තුළින් සැපයෙන විදුලිය මුලින්ම ශේෂධාරා පරිපථ බිඳිනය තුළින් ගමන් කරයි.
(3) පැරණි ගෘහ පරිපථවල විලායක සියල්ල විබෙදුම් පෙට්ටිය තුළ සවිකර ඇත.
(4) ගෘහයේ පහන් පරිපථවල 6 A හා කෙවෙනි පරිපථවල 13A සිගිති පරිපථ බිඳින යොදා ඇත.
(5) පහන් පරිපථවල සෑම බල්බයකම ස්විච්යක් සම්බන්ධ කරනුයේ සජීවී රැහැනටය.

39. විදුලිය හා සම්බන්ධ ඒකකයක් වන 'වොට්' මගින් මනිනු ලබන්නේ මින් කුමක් ද?

(1) විභව අන්තරය (2) ධාරාව (3) ජවය
(4) වෝල්ටීයතාව (5) ප්‍රතිරෝධය

40. විදුලි උපකරණ හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - විදුලි උපකරණය භූගත රැහැනට සම්බන්ධ කර ගැනීම තුළින් උපකරණය මෙන්ම පරිහරණය කරන්නා ද ආරක්ෂා වේ.

B - ජේනුවලට සම්බන්ධ වන උදාසීන රැහැන නිල්පාට වන අතර සජීවී රැහැන දුඹුරු පාට වේ.

C - ජලය රත්කර ගැනීම සඳහා වඩාත් සුදුසු වන්නේ ගිල්ලුම් තාපකයයි.

මින් නිවැරදි වනුයේ,

(1) A පමණි. (2) B පමණි.
(3) A සහ C පමණි. (4) B සහ C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය.

41. වර්ෂාපතනය වැඩි වීම නිසා ඇතිවිය හැකි බලපෑම් දෙකකි,

(1) ප්‍රභාසංශ්ලේෂණය අඩු වීම සහ වසංගත රෝග වර්ධනය.
(2) ජීවීන් වඳ වී යාම සහ පාංශු ඛාදනය වැඩිවීම.
(3) වසංගත රෝග වර්ධනය සහ ආලෝක තීව්‍රතාව වැඩි වීම.
(4) ප්‍රභාසංශ්ලේෂණය අඩු වීම සහ ජීවීන් වඳ වී යාම.
(5) ආලෝක තීව්‍රතාව වැඩි වීම සහ පාංශු ඛාදනය වැඩිවීම.

42. පහත කරුණු සලකන්න.

A - ඕට්ස් - කොලෙස්ටරෝල් මට්ටම පාලනය

B - කොළ තේ - දියවැඩියාව පාලනය

C - මිදි යුෂ - හෘදයේ නිරෝගී බව

මින් ක්‍රියාකාරී ආහාරය හා ඉන් ලැබෙන ප්‍රතිලාභය නිවැරදිව සඳහන් ප්‍රකාශ/ප්‍රකාශය වනුයේ,

(1) B පමණි.
(2) A සහ B පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.
(5) A, B, C යන සියල්ලම ය.

43. ජාන විකරණය කළ ආහාරයක් වන්නේ මින් කුමක් ද?

(1) බඩ ඉරිඟු (2) දඹල (3) වට්ටක්කා (4) අල (5) නෙල්ලි

44. පහත ලක්ෂණ සලකන්න.

A - ස්වාභාවිකව ජනනය වීමේ හැකියාවක් තිබීම

B - භාවිත කරන වේගයට වඩා අඩු වේගයකින් ජනනය වීම

C - කෙටි කාලයක දී ස්වාභාවික උත්පාදන ක්‍රියාවලිය මගින් නැවත ප්‍රතිස්ථාපනය කළ හැකි වීම

මේවායින් පුනර්ජනනීය සම්පතක ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ,

(1) A පමණි. (2) A සහ B පමණි.
(3) A සහ C පමණි. (4) B සහ C පමණි.
(5) A, B, C යන සියල්ලම ය.

45. නව යොවුන් විය අවුරුදු 10-20 කාලසීමාව බව අර්ථකථනය කල මනෝවිද්‍යාඥයා කවුද?

(1) ජීන් පියාජේ (2) සිග්මන් ෆ්‍රොයිඩ් (3) ගෙසල්
(4) හර්ලොක් (5) ස්ටොට්

46. පහත කරුණු සලකන්න.

A - ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය ආරම්භ වීම

B - මාංශ පේශී වර්ධනය ශීඝ්‍රයෙන් සිදුවීම

C - යෞවනෝදය අවුරුදු 11-15 අතර වීම

D - උස වැඩිවීම අවුරුදු 10-14 අතර සිදුවීම

මේවායින් යොවුන් ගැහැනු දරුවන් හා සම්බන්ධව නිවැරදි වනුයේ,

(1) A සහ B පමණි. (2) A සහ D පමණි.
(3) B සහ C පමණි. (4) A, C සහ D පමණි.
(5) B, C සහ D පමණි.

47. සමබර පෞරුෂයක් ඇති පුද්ගලයකුගේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. මින් චිත්තවේගී සමබරතාව පිළිබිඹු කරන ලක්ෂණය කුමක් ද?
(1) ඉදිරිපත් වීමේ හැකියාව
(2) පරිසරයට අනුව හැසිරීම
(3) ගැටළුකාරී තත්ත්වවලට ඔරොත්තු දීම
(4) ප්‍රියමනාප බව
(5) ක්‍රියාශීලීව ජීවත්වීම

48. මානසිකව රෝගී වූ දරුවකු තුළ දක්නට ලැබෙන මනෝකායික තත්ත්ව දෙකක් වන්නේ,
(1) හිසරදය සහ උදරාබාධයි.
(2) සෙම්ප්‍රතිශ්‍යාව සහ උණයි.
(3) උණ සහ හිසරදයයි.
(4) වමනය සහ කැස්සයි.
(5) උදරාබාධ සහ සෙම්ප්‍රතිශ්‍යාවයි.

49. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) නිවැරදි ව්‍යාපාර සැලැස්මක ඇතුළත් වනුයේ ව්‍යාපාර විස්තරය හා අලෙවිකරණ සැලැස්මයි.
(2) ඵලදායිතාව වශයෙන් හඳුන්වනුයේ යෙදවුම් නිමවුම් බවට පත්වීමේ අනුපාතයයි.
(3) තරගකාරීත්ව විශ්ලේෂණය, ශදූඅත විශ්ලේෂණයට වඩා ඉදිරිගාමී ක්‍රියාවලියකි.
(4) ව්‍යාපාරයක ඵලදායිතාව වැඩිකිරීම සඳහා කයිසෙන් සංකල්පය උපයෝගී කර ගත හැකි ය.
(5) ව්‍යාපාරයක ඵලදායිතාව හා සම්බන්ධව, සලකා බලන උවමනා හතරකි.

50. පහත ප්‍රකාශ සලකන්න.

A - ව්‍යවසායකත්වය සඳහා ප්‍රධාන කාර්යයන් දෙකක් වැදගත් වේ.
B - ව්‍යාපාරයක නියැලීමේ දී පාරිභෝගික අවශ්‍යතා ඉටුකිරීම බාහිර ආචාර ධර්මයකි.
C - මැක්ලෙලන්ට අනුව ව්‍යවසායකයකු තුළ ප්‍රධාන පෙළඹීම් තුනක් ඇත.
D - සමාජයක ව්‍යවසායකයන් බිහිවන්නේ ප්‍රධාන වශයෙන් සමාජ හා ආර්ථික බලපෑම මත ය.

මින් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) D පමණි. (5) C සහ D පමණි.

* * *

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

1. (i) ගෘහයක වහලය නිර්මාණයේ දී යොදා ගත හැකි තාප පරිවාරක ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.
(ii) විදුලි සැපයුම හා සම්බන්ධ 'වෙන්කරණය' හඳුන්වන්න.
(iii) විටමින් D සහ විටමින් E වල රසායනික නාම පිළිවෙළින් ලියන්න.
(iv) මිනිස් සිරුරෙහි යකඩ අවශෝෂණය වැඩි කිරීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න.
(v) පුද්ගල ආරක්ෂාව සඳහා රෙදිපිළි හා ඇඳුම්වලට යොදන නිමාවන් **දෙකක්** සඳහන් කරන්න.
(vi) නිමි ඇඳුම්වල ගුණාත්මක බවට බලපාන කරුණු **දෙකක්** ලියන්න.
(vii) සංචරණයේ ප්‍රධාන ධාරා දෙකකි. ඒවා නම් කරන්න.
(viii) පරිසර හිතකාමී වගාවක් පවත්වා ගැනීමේ දී යොදා ගන්නා ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.
(ix) විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය **දෙකක්** නම් කරන්න.
(x) ගැහැණු හා පිරිමි දරුවන්ට පොදු ද්විතීයික ලිංගික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

2. (i) 'අවම ශක්ති පරිභෝජනය' නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)
(ii) අභ්‍යන්තර පරිසරයට ගැළපෙන පරිදි ස්වාභාවික ආලෝකකරණය සිදු කරන ආකාර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)
(iii) පැහැදිලි කරන්න.
(a) සුමට හූ දර්ශනය
(b) භෞතික අක්ෂ (ලකුණු 04 යි.)
(iv) (a) ශක්ති ප්‍රභව ප්‍රධාන ආකාර දෙකකි. ඒවා නම් කරන්න. ඒ එකිනෙකට උදාහරණය බැගින් ලියන්න.
(b) ජීව වායුව නිපදවා ගන්නා අයුරු විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

3. (i) ආහාර විෂවීම කෙරෙහි බලපාන සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)
(ii) අවුරුදු 1- 5 දක්වා දරුවන්ට ආහාර ලබාදීම සම්බන්ධ පෝෂණ උපදෙස් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)
(iii) ආමාශයික ප්‍රදාහය ඇතිවීම කෙරෙහි බලපාන සාධක **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
(iv) අධි රුධිර පීඩනය සහිත රෝගියකු සඳහා දිනක බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

[දෙවැනි පිටුව බලන්න.

4. (i) ආහාරයක ඔක්සිකරණ/ඔක්සිහරණ විභවය ක්ෂුද්‍රජීවී වර්ධනයට බලපානුයේ කෙසේ ද? (ලකුණු 03 යි.)

(ii) ආහාර පරිරක්ෂණය සඳහා භාවිත කරන ජෛව රසායනික ක්‍රමයක් නම් කරන්න. එමගින් ආහාරය පරිරක්ෂණය වන අයුරු උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) කෙටි සටහන් ලියන්න.

(a) ජීවානුහරණය

(b) ආසුැති විජලනය (ලකුණු 08 යි.)

(මුළු ලකුණු 16 යි.)

5. (i) රෙදිපිළිවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා යොදන තාක්ෂණික ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) නිෂ්පාදන ක්‍රියාවලිය හා ව්‍යුහය අනුව රෙදි වර්ගීකරණය ඉදිරිපත් කරන්න. ඒ එකිනෙකට උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) වෘත්තාකාර මේස දරණුවක අද්දර නිම කිරීම සඳහා උචිත ක්‍රම **දෙකක්** නම් කර, ඉන් **එක්** ක්‍රමයක් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iv) පැහැදිලි කරන්න.

(a) රෙදි පින්තාරු කිරීම

(b) ඇප්ලික් කිරීම (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

6. (i) පරිසරයේ හරිතාගාර වායු ප්‍රමාණය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි.)

(ii) කර්මාන්තශාලාවලින් පිටවන ද්‍රව අපද්‍රව්‍ය මගින් පරිසරයට වන බලපෑම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(iii) (a) 'ප්‍රතිමෝදනය' අර්ථ දක්වන්න. (ලකුණු 02 යි.)

(b) ප්‍රතිමෝදනයෙහි වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(iv) අධ්‍යාපනික සංචරණය සිසුන්ට වැදගත් වේ. සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

7. (i) 'පෞරුෂය' හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) සමබර පෞරුෂයක් සහිත පුද්ගලයෙක් තුළ පවත්නා 'මානසික සමබරතාව' යනුවෙන් කුමක් අදහස් කරයි ද? (ලකුණු 04 යි.)

(iii) නව යොවුන් විය සංක්‍රාන්ති අවධියකි. එහෙයින් දරුවා බොහෝ විට චිත්තවේග අසමතුලිතතා පෙන්වයි. පහදන්න. (ලකුණු 04 යි.)

(iv) මානසික පීඩනයෙන් පෙලෙන යොවුන් දරුවකු ඉන් මුදවා ගැනීමට ක්‍රියාකළ යුතු ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

8. පහත දැක්වෙන මාතෘකා අතුරින් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) කාලය හා අවකාශයට අනුකූලව ගොඩනැගිලි නිර්මාණය

(ii) ආහාර වේල් තුළ ධාන්‍ය සහ ධාන්‍ය නිෂ්පාදන ඇතුළත් කිරීම

(iii) පතරොම භාවිත කරමින් සාය කපාගන්නා ආකාරය

(iv) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය

(v) යොවුන් අවධියේ සමාජ වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ

(ලකුණු $04 \times 4 = 16$ යි.)

* * *